සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: 1/11 | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි**

- **පළමු කොටසෙහි අංක 01 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. 1,11 පිළිතුරු පත්‍ර එකට අමුණා බාර දෙන්න.**

---

**ඉරිඇඳි යෙදුම් වලට වඩාත් උචිත ඉඟි වැකිය තෝරන්න.**

(01) වෛද්‍යවරයා <u>උදැසනින් ම</u> රෝහලට පැමිණියේ ය.

1. කරල පැහුණා 2. කිඹුල් කඳුළු 3. කුකුළා අතින් ගෙන 4. තරු පෙනුණා.

(02) මාරක රිය අනතුරින් ඔහු <u>යාන්තමින්</u> බේරිණි

1. හිස හැරුණු අතෙන් 2. අනූ නවයෙන් 3. මූණ ඇඹුල් වීමෙන් 4. දෙහි කැපීමෙන්.

හිස් තැනට සුදුසු පදය තෝරන්න.

(03) ගමරාල සහ ගම හාමිනේ හේනට ................................(යන්නීය/යති)

(04) දිසාපාමොක් ................................(ආචාරීහු/ආචාරීන්) බ්‍රහ්මදත්ත කුමරුට ශිල්ප ඉගැන්වූහ.

(05) ආරාධිතයෝ පැමිණ ජයග්‍රාහී ..............................(ක්‍රීඩකයෝ/ක්‍රීඩකයන්)මුණ ගැසුණෝය.

නිවැරදි වාක්‍යය තෝරන්න.

(06) 1. . රජතුමා ප්‍රධාන දේශනය පවත්වති.
2. .දෙමාපියන් උදැසන රැස්වීමට පැමිණෙති
3. .වාහන පෙළ වේගයෙන් ඉදිරියට ගමන් කරති.
4. උපදේශකවරු ගුරුභවතුන් දැනුවත් කරති.

(07) ඉදිරියෙන් දී ඇති ව්‍යාකරණ ගණයට අයත් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

1.යුගල පද - ඇත මැත, කරදර ,කවා පොවා.
2. උපසර්ග පද - සුසිරිත් ,අභිමානය ,පරසිරිත
3. සමාන පද - අහස -නුබ ,මුහුද -සිඳු ,මුහුණ -වත.
4. විරුද්ධ පද - කීර්තිය -අපකීර්තිය ,නියත--අනියත,පෙරදිග- අපරදිග.

(08) " සිසු දරුවා ගුරුතුමාගේ කතා බහට ආචාරශීලී ව සවන් දෙමින් ප්‍රතිචාර දක්වයි. "
ඉහත වාක්‍යයෙහි භාවිත විශේෂණ පද වන්නේ ,

(1) සිසු - ආචාරශීලීව (2). දරුවා - සවන් දෙමින්
(3) ගුරුතුමා - ප්‍රතිචාර (4) සිසු - සවන් දෙමින්

(09) " ගහට ඉණි කැපුවා වාගේ " යන ප්‍රස්තාව පිරුළෙන් ප්‍රකාශ වන්නේ,
(1) පහසු ක්‍රියාවකි (2) නිෂ්ඵල ක්‍රියාවකි.
(3) ගහේ ඉණි සිට වීමකි. (4) දුෂ්කර ක්‍රියාවකි.

(10) " ලොව පුරා <u>ජනයා බහුල ව වාසය කරන</u> ප්‍රදේශවල පරිසර දූෂණය ශීඝ්‍රයෙන් වැඩි වී ඇත. "
මෙහි ඉරි ඇඳි කොටසේ තනි පදය වන්නේ,
(1) ජනාවාස (2) ජනාශ්‍රිත
(3) ජන ශූන්‍ය (4) ජනාකීර්ණ

(11) "කිරි දියරක් වගේ ඉහිරෙන සුදට සුදේ
සඳ රැස් වැදෙයි දැන් දැන් පොඩි දුවගේ ඇඳේ"
මෙහි සඳහන් වන උපමාව හා උපමේය වන්නේ ,

(1) සුදු පාට - සඳරැස් (2) කිරි දියර - පොඩි දුව
(3) සඳරැස් - පොඩි දුව (4) කිරි දියර - සඳරැස්

(12) "පුතා, මෙහෙ එන්න. අද ගොඩක් වැඩ තියනවා."
A –පෙරළි උඩුකොමා/කොමාව/තිත
B - කොමාව/පෙරළි උඩු කොමාව/තිත
C- තනි උඩුකොමා/කොමාව/තිත
D- පෙරළි උඩුකොමා/තිත/කොමාව

මෙහි යෙදී ඇති විරාම ලකුණු අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) B වලිනි. (2) A වලිනි (3) C වලිනි (4) D වලිනි.

(13) පහත සඳහන් වචනවල හිස්තැනට ගැළපෙන අක්ෂර පිළිවෙළින් යෙදී ඇති පේළිය සොයන්න.

ප්‍රස්.... ව - නිර්මා..... ය -ප්‍රදර්....නය - යුව.....
(1) තා , න,ශ , ළ (2) ථ ,න ,ශ , ල (3) තා ,ණ ,ශ .ල (4) තා ,ණ ,ශ ,ළ

(14) මර්....නය -ප්‍රති.....ල -සාකච්....ච - රක්ෂ...ය

(1) ද,ඵ ,චා ,ණ (2) ධ ,ඵ ,ඡා , න (3) ද ,ඵ ඡා .ණ (4) ධ ,ප ජා ,න

(15) "ත්‍යාග ප්‍රදානෝත්සවයට පැමිණි ආරාධිත අමුත්තන් කැඳවා ගෙන විදුහල්පතිතුමා රඟහලට පැමිණෙයි"

ඉහත වාක්‍යයෙහි යෙදී ඇති මහාප්‍රාණ අක්ෂර ගණන කීය ද ?

1) 1යි . (2) 2 යි. (3) 3 යි. (4) 4 යි.

(16) ඉහත වාක්‍යයෙහි සඤ්ඤක අක්ෂර ගණන කීයද ?

1) 3යි . (2) 1 යි. (3) 2 යි. (4) 4 යි

(17) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1.අරලිය , රෝස , ඉද්ද , ඇන්තූරියම්

2.කඩවත , කලුතර , කෑගල්ල , කොළඹ

3.සිරිල් ,සිරිපාල , සිරිනත් , සිරිමල්

4. නරුන් . නලින් , නදීකා ,නවීනා

(18) "ගී කිය කියා දර කඩමින් ඉවුරු දිගේ - දුව පැන නටන කෙළිබර තුනු සපුව ඇගේ "

" බටපොතු පෙට්ටි පුරවා එක පිට එකට - නෑනේ වරෙන් ඒ අස්වන් නෙළන්නට"

A. - කිය කියා - මිශ්‍ර ක්‍රියා
B. - පැන -විධි ක්‍රියා
C. - පුරවා - පූර්ව ක්‍රියා
D. - වරෙන් - ආශිර්වාද ක්‍රියා

ඉරි ඇඳි පදවල නිවැරදි පෙළ ගැස්ම වන්නේ,

(1) A හා C
(2) B හා C
(3) A හා D
(4) C හා D

(19) සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය දිනා ගත් ප්‍රථම ආසියාතිකයා වූයේ,

(1) කුමාරතුංග මුණිදාසය. (2) රබින්ද්‍රනාත් තාගෝර් ය
(3) මහත්මා ගාන්ධි ය. (4) මාර්ටින් වික්‍රමසිංහ ය.

(20) "අහසේ තරු වැල් පිරිලා - පොළොවේ සුදුමල් පිපිලා"
ඉහත පද්‍ය පාඨයේ සඳහන් වන කාලය කුමක්ද ?

(1) උදෑසන කාලය (2) දහවල් කාලය
(3) රාත්‍රී කාලය (4) සවස් කාලය

( ලකුණු 2 x 20 = 40 )

## 11 කොටස

1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3,4,5,6,7 ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න **තුනක්** තෝරා ගෙන **ප්‍රශ්න පහකට** පිළිතුරු ලියන්න**.**

ඉගෙනුම් අවස්ථාවක් ලෙස සාම්ප්‍රදායික යෙදුම් සම්බන්ධයෙන් පොත් පිංචක් සැකසීමට ඔබට සිදු වෙයි.ඒ ඇසුරින් පිළිතුරු සපයන්න.

(1) මෙම පොත සැකසීමට ලැබුණු උපදෙස් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)
(2) මෙම ක්‍රියාකාරකම තුළ ඔබ මුහුණ දුන් ගැටලු **දෙකක්** ලියන්න . ( ලකුණු 02 යි)
(3) පොත් පිංච සැකසීමට තොරතුරු සොයා ගත් ක්‍රම **තුනක්** ලියන්න. ( ලකුණු 03 යි)
(4) එහි ඇතුළත් කළ සාම්ප්‍රදායික යෙදුම් **තුනක්** ලියන්න. ( ලකුණු 03 යි)
(5) පොත් පිංච සැකසීමට ඔබට උපකාර කළ **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)
(6) පොත් පිංච නිර්මාණය කිරීමෙන් ලද වාසි **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)
( මුළු ලකුණු 16)

(02) පහත සඳහන් මාතෘකාවලින් **එකක්** තෝරා ගෙන **වචන 150 කට** නො අඩු වන සේ රචනයක් ලියන්න.

(1) මා කැමති සංස්කෘතික උත්සවය.
(2) ජනකවිය අපගේ උරුමය යි.
(3) පෝෂණ ආහාර ගෙන නීරෝගි වෙමු.
(4) පොත් කියවා දැනුම ලබමු.
(5) වනාන්තරයක අතරමං වූවෙමි. ( මුළු ලකුණු - 14 )

**පෙළ පොත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(03) "මේකේ හැඬේ දිගටියටත් තියෙනවා ,රවුමටත් තියෙනවා."

1. මෙසේ ප්‍රකාශ කරන්නේ කවුරුන් ද?
2. කාහට ද?
3. මෙම කොටස ඇතුළත් පාඩම කුමක්ද ?
4. "මේකේ හැඬේ "ලෙස හඳුන්වන නැති වූ දෙය කුමක්ද ?
5. මෙම පාඨය ඇතුළත් වූ කතා වර්ගය කුමක්ද ? (ලකුණු 2 x 5 = 10 )

(04) මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
........................................
.......................................

1. පද්‍ය කොටසේ හිස්තැන් පද සම්පූර්ණ කරන්න .
2. මෙම නිර්මාණය ඇතුළත් පාඩමේ නම කුමක්ද ?
3. මෙහි නිර්මාණ කරුවාගේ වෙනත් පද්‍ය කෘති දෙකක් නම් කරන්න.
4. මෙම කවියා කුමන යුගයක් නියෝජනය කරයිද ?
5. මෙහි සඳහන් උපමාවක් හා උපමේයක් ලියන්න.

(ලකුණු 2 x 5 = 10 )

(05) **පැදි පෙළ කියවා අසා ඇති  ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

මා දිනු ගමේ පොඩි කාලේ වෙසෙන කල
මතකයි හොඳට නා ගහ මුල තිබුණ පැල
කවුරුත් දන්න හඳුනන යක් ගැහැලෙ හෙළ
කණ උන් දැය විසුවේ මේ කුටිය තුළ

ඇගෙ ඇස් දෙකම අන්දය එනමුත් පුදුම
අඳුනන්නීය ඈ කොස්විනි මුළු ගමම
දුප්පත් නමුත් ඈ කවදාවත් එහෙම
පහතට නොබැස්සා හිඟමනකට තරම

හරකා සතා මඟදී හමුවන ඇයට
කාගෙද කියා කිව හැකි නිවැරදි ලෙසට
කොපමණ දුරට ඈ හුරු පුරුදු ද ගමට
බල්ලෙක් පවා නුඹුරයි කිසි විට ඇයට

ඈ හොඳ හොඳ කතා කවි සී පද දන්නී
ඒවා රසට පැය ගණනක් පවසන්නී
අපගේ විහිළු ගැන වෙනසක් නොතකන්නී
කණ උන්දෑ අපේ මිතුරිය වී උන්නී

(1) මෙම  පැදි පෙළෙන් කියැවෙන්නේ කවුරුන් ගැනද ?
(2) මෙහි විස්තර කරන චරිතය ජීවත් වූයේ කොහේද ?
(3) මතුවන චරිත ලක්ෂණ දෙකක් ලියන්න.
(4) කොස්විනිගම කෙරෙහි වූ බැඳීම ප්‍රකාශ වන අවස්ථා දෙකක් ලියන්න.
(5) ගමේ දරුවන් කෙරෙහි දැක් වූ සෙනෙහස කවියා කෙසේ ප්‍රකාශ කරයිද?

(ලකුණු 2 x 5 = 10 )

(06) පහත දී ඇති ගද්‍ය පද්‍ය කොටස්වල ඉරි ඇඳී  පදවල අර්ථය ලිහිල් කර,සමස්ත අර්ථය ලියන්න.

(1) “1941 දී තාගෝර්ගේ අසූවන <u>ජන්මෝත්සවය</u> සරල අන්දමින් පවත්වන ලදී .ඒ  සමයෙහි දෙවන ලෝක යුද්ධය පැතිරෙමින් තිබිණි “

(2) පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල

<u>විලිකුන්</u> සුරත් පල වැනි වේ රිවි මඬල

(ලකුණු 2 x 5 = 10 )

(07) ඔබ පාසලේ 8 ශ්‍රේණියේ සිසුන්ගේ අවුරුදු පොළ මෙවර අප්‍රේල් 02 දිනට යොදා ගෙන ඇත. අවුරුදු පොළ විවෘත කරන ප්‍රධාන ආරාධිත අමුත්තා වන්නේ කලාප අධ්‍යක්ෂතුමයි.එතුමාට පැමිණෙන ලෙස දන්වා යවන ලිපිය ලියන්න. අරමුණ ,දිනය ,වේලාව , ස්ථානය සඳහන් කරන්න .පාසලේ පොළ කමිටුවේ ලේකම් ඔබ යැයි සිතන්න.

(ලකුණු 10 යි)

හෝ

"කැලි කසළ වලින් තොර පාසල් පිරියතක්" යන තේමාව යටතේ පාසල් පරිශ්‍රය පවිත්‍ර කිරීමේ ශ්‍රමදානයට කැඳවීම සඳහා දෙමාපියන් දැනුම්වත් කරන දැන්වීම් පත්‍රිකාවක් සකසන්න.
(අරමුණ ,දිනය ,වේලාව,ස්ථානය රැගෙන ආ යුතු දෑ විශේෂයෙන් සඳහන් විය යුතුයි) විද්‍යාලයේ පරිසර නියමු භට කණ්ඩායමේ ප්‍රධාන නියාමක ඔබ යැයි සිතන්න.

(ලකුණු 10 යි)